# ශ්‍රී ලංකාවේ ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන පාසල්වල සේවයේ යෙදී සිටින ගුරු භවතුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා හා ඒ සම්බන්ධයෙන් පවත්නා ගැටළු පිළිබඳ අධ්‍යයනයක්


එස්. වීරසිංහ

ශාස්ත්‍රවේදී උපාධි (කැලණිය වි.වි.)

ප.උ.අ.ඩිප්. (කොළඹ වි.වි.), ප.උ.අ.ඩිප්. නාට්‍ය හා රංග කලාව (කොළඹ වි.වි.),

අධ්‍යාපනපති (කොළඹ වි.වි.)



UCLIB

544765


කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය

සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධණය


2003/M. Phil/11

2008

# සාරාංශය

දුෂ්කරතා බැහැර කිරීමට, අඥාණත්වය, පීඩනය, චංඩත්වය, සංග්‍රාමය අඩුකර ගැනීමට, පෝෂණය කර හද වඩා ගත හැකි මිනිසා සතු ප්‍රධානතම ශක්ති ප්‍රභවය අධ්‍යාපනයයි. සැමට, නොමිළයේ අනිවාර්යයෙන්ම, සාධාරණව, අධ්‍යාපනය ලබාදිය යුතු බව ජෝම්ටියන් සමුළු වාර්තාව (1990) පෙන්වා දී තිබේ. ශ්‍රී ලංකාව ද එම ප්‍රඥප්තිය එකඟව ක්‍රියාත්මක කිරීමට විවිධ උපාය මාර්ග අනුගමනය කරමින් සිටී. පාසල් පද්ධතියට අවශ්‍ය තරම් ප්‍රමාණාත්මකව භෞතික හා මානව සම්පත් බෙදා හැරීමට රජය උත්සාහ දරා තිබේ. පාසල් අධ්‍යාපනයේ අපේක්ෂිත ගුණාත්මක සංවර්ධන ක්‍රියාවලියේදී, ප්‍රමුඛ කාරකයා වනුයේ ගුරුවරයාය. අධ්‍යාපනයේ මූලික ඉලක්කය වන ගුණාත්මක මානව සම්පත් සංවර්ධන ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීමේදී ගුරු වෘත්තීය සංවර්ධනය ප්‍රථමයෙන් සිදුකළ යුතුව ඇත. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 98/4 චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකාවේ පාසල් වර්ගීකරණයේදී වඩාත් ප්‍රියමනාප, ප්‍රියමනාප, ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන වශයෙන් පාසල් බෙදා තිබේ. ශ්‍රී ලංකාවේ පාසල් සංඛ්‍යාවෙන් අඩක් ඉක්මවන ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන පාසල් සංඛ්‍යාව 5335කි. ඉහත වර්ගීකරණයේ ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන යනුවෙන් කරන ලද අර්ථකථනයෙන් සෙසු පාසල්වලට සාපේක්ෂව එම පාසල් අවාසිදයක තත්ත්වයක පසුවන බව අවධාරණය වේ. සැමට අධ්‍යාපන සංකල්පය යටතේ, මෙම පාසල්වල ගුණාත්මක සංවර්ධනයක් ඇතිකිරීම අනිවාර්ය වේ. ඒ සඳහා මෙම වර්ගයේ පාසල්වල සේවය කරන ගුරු භවතුන්ගේ වෘත්තීය සංවර්ධනය සියල්ලට පෙර කළ යුතුය. ඒ සම්බන්ධයෙන් පවතින ගැටළු හා බාධක කවරේද යන්නත්, එම ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධන අවශ්‍යතා කවරේද යන්නත්, විමසීම අධ්‍යතන පර්යේෂණයේ සමස්ත අරමුණ වේ. එම ප්‍රධාන අරමුණ සුවිශේෂ අරමුණු 7ක් ඔස්සේ විමර්ශණයට ලක් කෙරේ. ගුරු භවතුන්ගේ වෘත්තීය අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා සඳහා පවත්වන පාඨමාලා, එම පාඨමාලාවලට සහභාගීවීමට ඇති ඉඩකඩ, ඒ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ගේ ආකල්ප, කළමනාකරණ ගැටළු සහ පාඨමාලා හැදෑරීමෙන් ගුරුවරයාට ලැබෙන ප්‍රතිලාභ විමසීම සුවිශේෂ අරමුණු යටතේ සිදුවේ.

පළමුවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටළුවත්, ගැටළුවේ පසුබිමත්, පුළුල් විමසුමට ලක් කර තිබේ. මෑත වර්ෂවලදී පූර්ව සැලසුමකින් තොරව කඩිමුඩියේ කරන ලද ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් පටු රාමුවක සිරවීම නිසා ගුරුවරයාගේ අත්දැකීම් සංවර්ධනයට, දැනුම

යාවත්කාලීන කර ගැනීමට හෝ ඉගැන්වීමේ ක්‍රම ශිල්ප දියුණු කර ගැනීමට හෝ හේතු නොවූ බව පැහැදිලි වේ. සංකල්ප විග්‍රහයේදී ගුරුවරයා, ගුරු භූමිකාව, අධ්‍යාපනය, ගුරු අධ්‍යාපනය යන අංශ දර්ශනික මතවාද ඇසුරින් විග්‍රහ කර තිබේ. ගුරු අධ්‍යාපන වැඩසටහන් හා එහි විෂය මාලාව පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයේ ආරම්භය හා විකාශනයත් වර්ථමාන ස්වරූපයත් පුළුල් විමසුමකට ලක් කරමින් ජාතික අධ්‍යාපන කොමිසම (1992) දක්වා ඇති නිර්දේශ සලකා බලමින් ගැටළුව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කර තිබේ.

දෙවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ගැටළුවට අදාළව කරන ලද පෙර පර්යේෂණ පිළිබඳ සාහිත්‍ය දේශීය හා විදේශීය වශයෙන් වෙන් වෙන්ව විමසා තිබේ. පෙර සාහිත්‍ය පදනම් කරගෙන ගැටළුවේ ස්වභාවය තවදුරටත් විමර්ශණයට ලක් කර ඇති අතර පර්යේෂණය දියත් කළ යුතු දිශානතිය ඒ අනුව තීරණය කර තිබේ. සෑම රටකටම මානව සම්පත් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රියාවලියේදී පාසල් අධ්‍යාපනය ප්‍රධාන කාරකයක් වන නමුත් ප්‍රාදේශීයව අවාසිදයක පරිසර තත්ත්වයන් හා ගුරුවරයාගේ වෘත්තීය සංවර්ධන මට්ටම ඒ සඳහා බලපෑම් කරන බව පර්යේෂණ සාහිත්‍ය තුළින් පැහැදිලි වේ. පර්යේෂණ සාහිත්‍යයේ තොරතුරු පදනම් කරගනිමින් පර්යේෂණ ක්‍රමවේදය, ජනගහනය හා නියදියේ දත්ත රැස්කිරීමේ උපකරණ තීරණය කර තිබේ.

තුන්වන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාපන නොවන පාසල් අතරින් රත්නපුර, මොණරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්ක වලින් පාසල් 60ක පාසල් නියදියක්ද, 600ක ගුරු නියදියක් ද, 25 දෙනෙකුගෙන් යුතු විදුහල්පති නියදියක් ද, 50 බැගින් වූ ගුරු උප නියදි 02ක් ද, කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 12 දෙනෙකුගේ නියදියක් ද, ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් 04 දෙනෙකුගේ නියදියක් ද, අධ්‍යාපනවේදී පාඨමාලාවේදී ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් 04 දෙනෙකුගේ නියදියක් ද, ඉහළ කළමණාකරුවන් 04 දෙනෙකුගේ නියදියක් ද තෝරාගත් ආකාරය පැහැදිලි කර තිබේ. එසේම දත්ත රැස්කිරීමේ උපකරණ වන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නියමාවලි, නිරීක්ෂණ පත්‍රිකා හා ආකල්ප පරීක්ෂණ තනා ගන්නා ලද ආකාරයත් පර්යේෂණය දියත් කළ ආකාරය හා පර්යේෂණ සීමාත් පැහැදිලි කර තිබේ.

හතරවන පරිච්ඡේදයෙන් එක් එක් අරමුණු හා ඒ සම්බන්ධව ගොඩනගාගත් තේමා ඔස්සේ දත්ත විශ්ලේෂණය කර තිබේ. එහිදී විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය ප්‍රධාන වශයෙන් භාවිතා කරමින් ප්‍රතිශතක සංඛ්‍යා හා වගු, කයිවර්ග පරීක්ෂණ යොදා ගනිමින් කරන ලද විශ්ලේෂණය පදනම් කරගෙන අනාවරණ ඉදිරිපත් කර තිබේ. එම අනාවරණ පදනම්

කරගෙන නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම පස්වන පරිච්ඡේදයෙන් සිදුකර ඇත. ඒ අනුව ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන පාසල්වල සේවයේ යෙදී සිටින ගුරු භවතුන්ගේ වෘත්තීය අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සම්බන්ධව වෘත්තීය අධ්‍යාපන සංවර්ධන පාඨමාලා හා වැඩසටහන්වල ව්‍යුහය, කළමණාකාරීත්වය, පුහුණු කරුවන්ගේ ස්වභාවය, ගුරු භවතුන්ගේ සහභාගීත්වය, සේවා ආකෘතීන් හා ආකල්ප ප්‍රධාන ගැටළු ලෙස පවතින බව පර්යේෂණයේ සමස්ත නිගමනය ලෙස ඉදිරිපත් කර තිබේ. එයට අදාලව ප්‍රියමනාප නොවන හා වඩාත් ප්‍රියමනාප නොවන පාසල් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය ඉහළ නංවා පාසල ආකර්ශණීය ස්ථානයක් බවට පත් කිරීම සඳහා එකී පාසල්වල සේවයේ යෙදී සිටින ගුරු භවතුන්ගේ අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා පදනම් කරගෙන ඔවුන්ගේ සේවා තෘප්තිය හා ඵලදායීතාවය නංවාලිය හැකි පරිදි දිගු කාලීන හා කෙටිකාලීන ගුරු අධ්‍යාපන වෘත්තීය සංවර්ධන පාඨමාලා සම්පාදනය කොට සේවා ස්ථානයට ආසන්න මධ්‍යස්ථානවලදී ක්‍රියාත්මක කිරීම හා නිර්නායක මූලිකව පසුවිපරමට ලක් කිරීම හා යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත. එසේම එම ගුරු භවතුන්ගේ පවුල්වල දරුවන්ගේ සුරක්ෂිතභාවය අධ්‍යාපනික අවශ්‍යතා පූරණය කර ගැනීමේ විධිමත් වැඩ පිළිවෙලක් සැකසීම ද කාලීන අවශ්‍යතාවයක් ලෙස යෝජනා කර ඇත.